# වාර්ෂික වාර්තාව -2022
# ஆண்டறிக்கை -2022
# Annual Report -2022

## හෝමියෝපති වෛද්‍ය සභාව
## ஹோமியோபதி மருத்துவ சபை
## Homoeopathic Medical Council

සෞඛ්‍ය අමාත්‍යාංශය, දේශීය වෛද්‍ය අංශය

சுகாதார அமைச்சு, சுதேச மருத்துவப் பிரிவு

**Ministry of Health, Indigenous Medicine Section**

# පටුන

පිටුව


| | |
|---|---|
| 1. සාරාංශය | 02 |
| 2. හැඳින්වීම | 03 |
| 3. හෝමියෝපති වෛද්‍ය සභාව | 04 |
| 4. පසුබිම් විස්තරය | 05 |
| 5. වෛද්‍ය සභාවේ අරමුණු | 07 |
| 6. වෛද්‍ය සභාව සතු බලතල | 08 |
| 7. වෛද්‍ය සභාවේ සාමාජිකත්වය සහ ධූර කාලය | 10 |
| 8. සංස්ථාපිත තොරතුරු | 11 |
| 9. හෝමියෝපති වෛද්‍ය සභාවේ කාර්ය සාධනය | 12 |
| 10. වාර්ෂික ගිණුම් වාර්තා | 20 |
| 11. විගණන වාර්තාව | 35 |

# 01. සාරාංශය

හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ජාතික සෞඛ්‍ය සේවාවක් දක්වා ප්‍රවර්ධනය කිරීම යන දැක්මෙන් යුක්තව හෝමියෝපති වෛද්‍ය ක්‍රමය අරභයා මානව හා භෞතික සම්පත් වර්ධනය කිරීම සම්බන්ධ නිසි ප්‍රතිපත්ති සම්පාදනය කරමින්, එය පොදු ජනතාව අතර ප්‍රචලිත කිරීම, නගා සිටුවීම හා අභිවර්ධනය කිරීම යන මෙහෙවර ඉටු කිරීමයි.

2020.09.09 දින පත් කරන ලද සාමාජිකයන් 11 දෙනෙකුගෙන් සමන්විත හෝමියෝපති වෛද්‍ය සභාව මේ වන විටත් ක්‍රියාත්මකව පැවතුනි.

පසුගිය වසරෙහි ද රටෙහි පැවති අස්ථාවරත්වය හේතුවෙන් යම් දිස්ත්‍රික්ක වසා තැබීම, ඩොලර් අර්බුදය හමුවේ ඇති වූ හෝමියෝපති ඖෂධ හිඟය සහ පොදු ප්‍රවාහනය ඇතුලු විවිධ සේවාවන්ගේ සිදු කෙරුණු සීමා කිරීම් වැනි විවිධ ගැටළුකාරී තත්ත්වයන් නිසා සිදු වූ සීමා කිරීම් වෛද්‍ය සභා කාර්යාලයේ හා වෛද්‍ය සායන වල කටයුතු අඩපන වීමට විශේෂයෙන්ම හේතු විය. එම දැඩි අසීරු තත්ත්වයන් පහව ගොස් 2022 වර්ෂය නැවත යථා තත්ත්වයට පත්ව සාමාන්‍ය පරිදි කටයුතු සිදුකෙරෙමින් පවතින මට්ටමකට පත් විය. සභාපතිතුමාගේ මඟ පෙන්වීම යටතේ සහ 2022.02.07 දින සිට නව ලේඛකාධිකාරී පත්වීමත් සමඟ හෝමියෝපති වෛද්‍ය සභාවේ කටයුතු මනා කළමනාකරණයක් යටතේ පවත්වාගෙන යාමට හැකි විය.

සභා කාර්යාල ගොඩනැගිල්ල හෝමියෝපති පාසල් ගොඩනැගිල්ල බවට තාවකාලිකව ස්ථාපිත කරන ලද අතර 2018 වර්ෂයේ සිට 2021 දක්වා නිම කර ගැනීමට නොහැකිව තිබූ වාර්ෂික වාර්තා සියල්ල පිළියෙල කර අවසන් කරන ලදී. හෝමියෝපති වෛද්‍ය සභාවේ නිල වෙබ් අඩවිය එළි දැක්වීමට හැකි වීම සුවිශේෂී ජයග්‍රහනයක් වන අතර ඒ තුළින් සේවා දායකයින් හට අවශ්‍ය තොරතුරු ඩිජිටල් තාක්ෂණය ඔස්සේ පහසුවෙන් ලබා ගැනීමට අවස්ථාව හිමි කර දී ඇත.

# 02. හැඳින්වීම

" සමාන දෙයින් සමාන දෙය සුවපත් කිරීම " යන ස්වාභාවික මූලධර්මය මත පදනම් වූ වෛද්‍ය ක්‍රමයක් ලෙස හෝමියෝපති වෛද්‍ය ක්‍රමය හැඳින්විය හැකිය. 18 වන සියවසේ දී මෙම වෛද්‍ය ක්‍රමය ලොවට හඳුන්වා දෙනු ලැබුවේ බටහිර වෛද්‍ය ක්‍රමයේ විශේෂඥයෙකු වූ ජර්මන් ජාතික ක්‍රිස්ටියන් ෆෙඩ්රික් හානිමාන් විසිනි. අද වන විට විද්‍යාත්මකව හා තාක්ෂණිකව වර්ධනය වෙමින් පවතින හෝමියෝපති වෛද්‍ය ක්‍රමය මහජන සෞඛ්‍ය සේවාව තුළ ප්‍රබල ස්ථානයකට පත් කිරීමට කටයුතු සිදුකරමින් පවතී. මේ වන විට ලොව පුරා හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ජාතික සෞඛ්‍ය සේවයට අනුයුක්ත කර, ලොව පුරා විහිදුණු හෝමියෝපති රෝහල් පද්ධතියක් මගින් මහජන සෞඛ්‍ය සේවා පැවැත්වීමට පමණක් සීමා නොවී, හෝමියෝපති වෛද්‍ය උපාධි ප්‍රදානය කරන විශ්ව විද්‍යාල, හෝමියෝපති ඖෂධ නිෂ්පාදන කරන කර්මාන්ත ශාලා සහ හෝමියෝපති පර්යේෂණ ආයතන ද බිහි කිරීමට මූලික අඩිතාලම දමමින් පවතින බව සඳහන් කළ යුතුය.

1970 අංක 07 දරණ හෝමියෝපති පනත මගින් මුලින්ම ශ්‍රී ලංකා හෝමියෝපති වෛද්‍ය සභාව ස්ථාපනය කළ අතර එය හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත කිරීමේ සහ වර්ධනය කිරීමේ භාර ධූර කාර්යයට උර දී ඇත. එහෙත් එහිදී පැන නැගි නීතිමය හා ව්‍යුහාත්මක බාධාවන් ඉදිරියේ අවසාන වශයෙන් වෛද්‍ය සභාව බිඳ වැටුණි. කෙසේ වෙතත් මෙම අභියෝගයන් ජය ගැනීමේ අරමුණ ද සහිතව 2016 අංක 10 දරණ හෝමියෝපති පනත පාර්ලිමේන්තුව විසින් සම්මත කෙරුණි. මෙම නව පනතේ I කොටසේ 2 වගන්තිය ප්‍රකාරව හෝමියෝපති වෛද්‍ය සභාව යළි පිහිටුවීම සඳහා වන කර්තව්‍යයන් ඉටු කිරීම පිණිස, හෝමියෝපති වෛද්‍ය සභාව පිහිටුවන ලදී. හෝමියෝපති වෛද්‍ය සභාවේ ලේඛකාධිකාරී මෙම සභාවේ ලේකම්වරයා වේ.

හෝමියෝපති වෛද්‍ය සභාවේ අරමුණු සාධනයෙහි ලා එහි කාර්ය භාරය යටතට ගැනෙන හෝමියෝපති වෛද්‍ය ක්‍රමය මහජන සෞඛ්‍ය සේවාවක් ලෙස ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් දිස්ත්‍රික් 13 ක රජයේ හෝමියෝපති සායන 13 ක් ස්ථාපිත කර තිබුණි. දෙහිවල, පරකඩුව, මොණරාගල, පාලමුනෙෙ, මාතලේ, කුරුණෑගල, තෝලංගමුව, පුත්තලම, කොත්මලේ, මඩකලපුව, අම්බලන්තොට, ඉංගිරිය, හා ගාල්ල මෙසේ වෛද්‍ය සභාව මගින් රජයේ හෝමියෝපති සායන පවත්වාගෙන යනු ලැබූ ස්ථාන විය.

2022 වසරේදී වෛද්‍ය සභාව විසින් මෙහෙයවන රජයේ හෝමියෝපති සායන වලට අමතරව පොළොන්නරුව ප්‍රදේශයේ එක් සායනයක වැඩ අවසන් කර ඇත. එම හෝමියෝපති සායනය විවෘත කිරීමට පමණක් ඉතිරිව තිබුණි.

# 03. හෝමියෝපති වෛද්‍ය සභාව

## දැක්ම

"හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ජාතික සෞඛ්‍ය සේවාවක් දක්වා ප්‍රවර්ධනය කිරීම"

## මෙහෙවර

"හෝමියෝපති වෛද්‍ය ක්‍රමය අරභයා මානව හා භෞතික සම්පත් වර්ධනය කිරීම සම්බන්ධ නිසි ප්‍රතිපත්ති සම්පාදනය කරමින්, එය පොදු ජනතාව අතර ප්‍රචලිත කිරීම, නගා සිටුවීම හා අභිවර්ධනය කිරීම."

## පරමාර්ථ

2016 අංක 10 දරණ හෝමියෝපති පනතේ විධි විධානවලට අනුකූලව හෝමියෝපති ක්ෂේත්‍රයේ වෘත්තීය අධ්‍යාපන හා සෞඛ්‍ය සේවාව ගුණාත්මකව සංවර්ධනය කිරීම හා දැනුම, කුසලතා හා පළපුරුද්ද සහිත වෘත්තිකයන් මගින් රෝගීන්ගේ නිරෝගීභාවය ප්‍රතිස්ථාපනය කිරීම හා නිරෝගී පුද්ගලයන්ගේ නිරෝගීභාවය සංරක්ෂණය කිරීම සඳහා වෘත්තීමය නෛතික අධිකාරීත්වය පිරිනැමීම මගින් වෘත්තීය ගෞරවය හා ගුණාත්මකභාවය සුරක්ෂිත කිරීම.

# 04. පසුබිම් විස්තරය

හෝමියෝපති වෛද්‍ය සභාව ව්‍යවස්ථාපිත ආයතනයකි. නව වෛද්‍ය සභාව **හෝමියෝපති වෛද්‍ය සභාව** ලෙස 2016 අංක 10 දරණ හෝමියෝපති පනත මඟින් නම් කෙරේ. තදනන්තර වෛද්‍ය සභාවත් නිල බලයෙන් පත් කෙරෙන රාජ්‍ය නිලධාරීන් තිදෙනෙකු, හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන් අතර ජන්දයෙන් තෝරා ගැනෙන සාමාජිකයින් පස් දෙනෙකු, හෝමියෝපති වෛද්‍යවරුන් දෙදෙනෙකු අනිවාර්යයෙන් ඇතුළත් වන සේ ගරු අමාත්‍යතුමා විසින් පත් කෙරෙන තිදෙනෙකු ඇතුළත් 11 දෙනෙකුගෙන් සැදුම්ලත් මණ්ඩලයකින් සමන්විත වේ. පනතේ ප්‍රතිපත්ති හා විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා වන නියෝග සෑදීමේ බලය ගරු අමාත්‍යතුමා සතු වන අතර නියම කර ඇති ක්ෂේත්‍ර සම්බන්ධයෙන් පනතට අනුකූලව රීති සම්පාදනය කිරීමේ බලය සභාව වෙත පවරනු ලැබ ඇත.

## නීති සහ රෙගුලාසි

2016 අංක 10 දරණ නව හෝමියෝපති පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයේදී බලාත්මකව පැවති සෑම නියෝගයක්ම, මෙම පනත යටතේ නියෝග සාදන තෙක්, මෙම පනත ප්‍රකාරව සාදන ලද නියෝග ලෙස පනතට අනුකූලව සැලකේ. නව පනත යටතේ අවශ්‍ය නියෝග සම්පාදනය සඳහා අවශ්‍ය කටයුතු මේ වන විට සිදුකරමින් පවතින හෙයින් 1970 අංක 07 දරණ හෝමියෝපති පනත යටතේ බලාත්මකව පැවති නියෝග මේ අනුව තවදුරටත් වලංගුව පවතී.

## <u>1970 අංක 07 දරණ හෝමියෝපති පනතට අනුව ප්‍රකාශයට පත් කර ඇති නියෝග</u>

1. හෝමියෝපති රෙගුලාසි - 1980

   (වෛද්‍ය වෘත්තිකයින් ලියාපදිංචි කිරීමේ රෙගුලාසි සහ හෝමියෝපති ඖෂධ ආනයනය)

2. හෝමියෝපති වෛද්‍ය සභාවේ නීති - 1981

3. හෝමියෝපති වෛද්‍ය සභා මැතිවරණ රෙගුලාසි - 1998

## හෝමියෝපති වෛද්‍ය සභාව ස්ථාපිත කිරීම.

මෙරට මුලින්ම හෝමියෝපති වෛද්‍ය සභාවක් පත්කර ඇත්තේ, 1970 අංක 07 දරණ හෝමියෝපති පනතට අනුකූලව, 1979 වසරේ දී විෂය භාර ගරු අමාත්‍යතුමා විසිනි. එම පනතට අනුව වසර 5 කට වරක් වෛද්‍ය වෘත්තිකයන්ගේ ඡන්දයෙන් වෛද්‍ය සභාව පත් කර ගත යුතු (පළමු වෛද්‍ය සභාව හැර) වුවද අඛණ්ඩව වෛද්‍ය සභාව පත් කර ගනු ලැබීමක් සිදුව නොතිබුණි. 1979 ට පසුව දෙවැනි වෛද්‍ය සභාව 1998 දීත්, තෙවැන්න 2006 දීත් වශයෙන් පත්ව ඇති අතර තුන්වෙනුව පත් කෙරුණ වෛද්‍ය සභාව 2009 දී නිල කාලය නිමවීමට පෙර විෂයභාර අමාත්‍යතුමා විසින් විසුරුවා හැර ඉතිරි වසර දෙකක කාලය සඳහා නව අතුරු පාලක කමිටුවක් පත් කරන ලදී.

එහි නිල කාලය 2011 ජනවාරි 30 දිනෙන් අවසන් විය. ඒ වන විට බල පැවති හෝමියෝපති පනතේ දුර්වලතා මගහැර නව පනතක් ගෙන එන තෙක් වෛද්‍ය සභාවේ කටයුතු පවත්වාගෙන යාම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතියක් මත ගරු අමාත්‍යතුමා හෝ අමාත්‍යාංශ ලේකම්වරයා හෝ මඟින් හෝමියෝපති අතුරු පාලක කමිටු පත් කෙරුණි. 2011 ජුනි 16 වැනි දින සිට 2016 අංක 10 දරණ නව හෝමියෝපති පනත හඳුන්වා දුන් 2016 ජූලි 29 තෙක්ම හෝමියෝපති වෛද්‍ය සභාවේ කටයුතු මෙහෙයවනු ලැබුවේ අතුරු පාලක කමිටුවක් මඟිනි. මෙසේ පත් කෙරුණු අතුරු පාලක කමිටු සංඛ්‍යාව 05කි. මෙම කාල වකවානුව පුරාම හෝමියෝපති වෛද්‍යවරුන්ගේ තාක්ෂණික කමිටුවක සහාය හෝමියෝපති අතුරු පාලක කමිටුවට ලැබුණි.

2016 අංක 10 දරණ නව හෝමියෝපති පනත සම්මත වීමෙන් පසුව 2016 ඔක්තෝබර් මස 21 දින සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය ගරු අමාත්‍යතුමා විසින් පනත මඟින් ඔහු වෙත ලබා දී ඇති බලතල වලට අනුකූලව හෝමියෝපති අතුරු වෛද්‍ය සභාවක් පත් කරන ලදී. පනතට අනුව මුලින්ම පත් කෙරෙනුයේ හෝමියෝපති අතුරු වෛද්‍ය සභාවය. එහි නිල කාලය වසර දෙකකි. මෙම අතුරු වෛද්‍ය සභාවේ නිල කාලය 2018 ඔක්තොම්බර් 19 දිනෙන් අවසන් විය.

2016 අංක 10 දරණ හෝමියෝපති පනත ප්‍රකාරව එහි නිල කාලය වසර තුනකි. 2020.09.09 දින සිට විෂයභාර අමාත්‍යවරයා විසින් හෝමියෝපති වෛද්‍ය සභාව පත් කරන ලදී. පනත බලාත්මක කිරීමට අත්‍යාවශ්‍ය වන නියෝග සම්පාදනයට අදාළ මූලික කෙටුම්පත් සකසා සම්මත කරවා ගැනීම මෙම සභාවේ ප්‍රමුඛ කාර්ය ලෙස සැලකුණි.

# 05. වෛද්‍ය සභාවේ අරමුණු

2016 අංක 10 දරණ හෝමියෝපති පනතට අනුව හෝමියෝපති වෛද්‍ය සභාවේ අරමුණු පහත සඳහන් පරිදි

1) හෝමියෝපති වෛද්‍ය වෘත්තියෙහි යෙදීම ප්‍රවර්ධනය කිරීම, අභිවර්ධනය කිරීම සහ නියාමනය කිරීම.

2) හෝමියෝපති වෛද්‍ය ක්‍රමයට අනුව මහජන සෞඛ්‍ය වර්ධනය කිරීමේ අරමුණ ඇතිව සමාජය තුළ හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ප්‍රවර්ධනය කිරීම.

3) හෝමියෝපති වෛද්‍ය ක්‍රමය පිළිබඳ අධ්‍යයනය කිරීම, පර්යේෂණ කිරීම සහ හෝමියෝපති වෛද්‍ය වෘත්තියේ යෙදීම ප්‍රවර්ධනය කිරීම සහ උනන්දු කරවීම.

4) හෝමියෝපති ආයතනයන් පිහිටුවා පවත්වා ගෙන යාම.

5) රජයේ හෝමියෝපති රෝහල හැර හෝමියෝපති වෛද්‍ය ක්‍රමයට අනුව ප්‍රතිකාර ලබාදෙන හෝමියෝපති ආයතන නියාමනය කිරීම සහ පාලනය කිරීම.

6) හෝමියෝපති බෙහෙත් වර්ග, ඖෂධ සහ වෙනත් පිළියෙල කිරීම්, නිෂ්පාදන, ආනයනය, ගබඩා කිරීම, විකිණීම සහ බෙදා හැරීම නියාමනය කිරීම සහ පාලනය කිරීම.

# 06. වෛද්‍ය සභාව සතු බලතල

පනතේ 16 වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් බලතල හෝමියෝපති වෛද්‍ය සභාව සතුවේ.

01) හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන්, හෝමියෝපති ඖෂධවේදීන්, හෝමියෝපති හෙදියන් සහ හෝමියෝපති ආයතන ලියාපදිංචි කිරීම.

02) හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන් ලබා ඇති අධ්‍යාපන සුදුසුකම් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම.

03) හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන් වෙත සුදුසුකම් ප්‍රදානය කළ ආයතන වෙතින් ඒ පිළිබඳ සහතික කරවා ගැනීම.

04) හෝමියෝපති වෛද්‍ය විද්‍යාල හෝ ආයතන නියාමනය කිරීම සඳහා පරීක්ෂකවරුන් පත් කිරීම.

05) හෝමියෝපති වෛද්‍ය ක්‍රමයට අනුකූලව ප්‍රතිකාර සේවා සැපයීම.

06) හෝමියෝපති ආයතන පිහිටුවීම, පවත්වා ගෙන යාම සහ පශ්චාත් අධ්‍යයන පාඨමාලා සකස් කිරීම.

07) හෝමියෝපති ඖෂධ ආනයනය හෝ අපනයනය.

08) හෝමියෝපති ඖෂධ විද්‍යාත්මකව නිෂ්පාදනය කිරීම හා දිරිමත් කිරීම.

09) හෝමියෝපති වෛද්‍ය පහසුකම්, උපකරණ, පාඨමාලා හා විභාග සම්බන්ධ අවම ප්‍රමිති නියම කිරීම හා පවත්වා ගෙන යාම.

10) හෝමියෝපති විෂය හදාරන්නන්ට ශිෂ්‍යත්ව සහ වෙනත් පහසුකම් ප්‍රදානය කිරීම, හෝමියෝපති පර්යේෂණ ආයතන දිරිමත් කිරීම, අවශ්‍ය ආයතන සහ පුද්ගලයින් සඳහා මුල්‍යාධාර හෝ වෙනත් සහන ලබාදීම.

11) පශ්චාත් උපාධි හෝමියෝපති වෛද්‍ය අධ්‍යාපනය සම්බන්ධ වෛද්‍ය අධ්‍යාපන අවම ප්‍රමිති නියම කිරීම හා පවත්වා ගෙන යාම.

12) හෝමියෝපති වෛද්‍ය ක්‍රමයට අනුකූලව මහජන සෞඛ්‍ය සේවාව වැඩිදියුණු කිරීම.

13) වෛද්‍ය විද්‍යාවට සම්බන්ධ උපාධි හා අනෙකුත් අධ්‍යාපන විශිෂ්ටතා ප්‍රදානය කිරීම සඳහා උසස් අධ්‍යාපන ආයතන සමඟ කටයුතු කිරීම.

14) 1978 අංක 16 දරණ විශ්ව විද්‍යාල පනතට අනුකූලව හෝමියෝපති වෛද්‍ය විද්‍යාලයක් පිහිටුවීම සම්බන්ධයෙන් කටයුතු කිරීම.

15) සභාවේ කාර්යය සහ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි මණ්ඩල හා කමිටු අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව පිහිටුවීම.

16) නිලධරයෙකු හෝ කමිටුවක් වෙත යම් බලතල හෝ කාර්යයන් පැවරීම.

17) සභාවේ බලතල, කාර්යය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සඳහා රීති සෑදීම.

18) පනත යටතේ බලතල හා කාර්යය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම.

## 07. වෛද්‍ය සභාවේ සාමාජිකත්වය සහ ධූර කාලය

2016 අංක 10 දරණ හෝමියෝපති පනතට අනුව වෛද්‍ය සභාවේ සාමාජික සංඛ්‍යාව සභාපති ද ඇතුළුව 11 කි. නිල බලයෙන් පත් වන රේඛීය අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු, භාණ්ඩාගාරයේ නියෝජිතයෙකු, සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නියෝජිතයෙකු ගෙන් සමන්විත රාජ්‍ය නිලධාරීන් තිදෙනෙකු, හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන් අතරින් ඡන්දයෙන් තෝරා ගැනෙන පස් දෙනෙකු සහ හෝමියෝපති වෛද්‍යවරුන් දෙදෙනෙකු ද අනිවාර්යෙන් ඇතුළත් වන පරිදි ගරු අමාත්‍යතුමා විසින් පත් කරනු ලබන තිදෙනෙකු සහිතව සාමාජිකයින් 11 දෙනා පත් කෙරේ. වෛද්‍ය සභාවේ ලේකම්/ලේඛකාධිකාරී පත් කරනු ලබන්නේ සභාව විසිනි. සභාව වසර තුනක් සඳහා පත් කෙරෙන අතර ලේකම්/ලේඛකාධිකාරී වසර 5 ක් සඳහා පත් කෙරේ.

# 08. සංස්ථාපිත තොරතුරු

| | | |
|---|---|---|
| ආයතනයේ නම | :- | හෝමියෝපති වෛද්‍ය සභාව |
| ලිපිනය | :- | අංක 94, ෂෙල්ටන් ජයසිංහ මාවත,<br>වැලිසර,<br>රාගම. |
| දුරකතන අංකය | :- | 011-2958175 |
| ෆැක්ස් | :- | 011-2958175 |
| විද්‍යුත් තැපෑල | :- | homosri.mcouncil@gmail.com<br>president@slhmc.lk<br>vice.president@slhmc.lk<br>registrar@slhmc.lk<br>info@slhmc.lk<br>office@slhmc.lk |
| වෙබ් අඩවිය | :- | www.slhmc.lk |
| සංස්ථාපිත ආයතනයේ තත්ත්වය | :- | 2016 අංක 10 දරණ හෝමියෝපති පනතේ 15,16 හා 17 වගන්ති ප්‍රකාර අරමුණු හා බලතල මත හෝමියෝපති වෛද්‍ය සභාව ස්ථාපිත කර ඇත. |
| පරිපාලන ව්‍යුහය | :- | ලේකම් / ලේඛකාධිකාරී<br>කාර්යභාර වෛද්‍යවරු<br>කළමනාකරණ සහකාර<br>ඖෂධ සංයෝජක<br>කාර්යාල සහායක |
| බැංකුකරුවෝ | :- | ලංකා බැංකුව - තැප්‍රොබේන් ශාඛාව,<br>මහජන බැංකුව - රාගම<br>කොමර්ෂල් බැංකුව - ජා ඇල |

# 09. හෝමියෝපති වෛද්‍ය සභාවේ කාර්ය සාධනය

පසුගිය වසරෙහි ද රටෙහි පැවති කොවිඩ් වසංගතය හේතුවෙන් යම් දිස්ත්‍රික්ක වසා තැබීම, පොදු ප්‍රවාහනය ඇතුලු විවිධ සේවාවන්ගේ සිදු කෙරුණු සීමා කිරීම් වැනි විවිධ ගැටළුකාරී තත්ත්වයන් නිසා සිදු වූ සීමා කිරීම් වෛද්‍ය සභා කාර්යාලයේ හා වෛද්‍ය සායන වල කටයුතු අඩපන වීමට විශේෂයෙන්ම හේතු විය. එම දැඩි අසීරු තත්ත්වයන් පහව ගොස් 2022 වර්ෂය නැවත යථා තත්ත්වයට පත්ව සාමාන්‍ය පරිදි කටයුතු සිදුකෙරෙමින් පවතින මට්ටමකට පත් විය.

2022 වසර ආරම්භ වූයේ අපේක්ෂිත කාර්ය සාධනයන් කරා නැවත ළඟා වීමට උත්සාහ දරා පවත්වාගෙන යන්නාවූ කාල පරිච්ඡේදයක් ලෙස බව සඳහන් කල යුතු අතර පෙර වසරේ දී පරිදිම, හෝමියෝපති වෛද්‍ය සභාව යටතේ සියළු කටයුතු මනා කළමනාකාරීත්වයක් යටතේ සිදු කරන ලදී. වසර මැද භාගයේ දී හෝමියෝපති පාසල් ගොඩනැගිල්ල කාර්යාල ගොඩනැගිල්ලක් බවට තාවකාලිකව ස්ථාපනය කරන ලදී.

## 9.1 රජයේ හෝමියෝපති සායනවල කාර්ය සාධනය හා කළමනාකරණය

### 9.1.1 රජයේ හෝමියෝපති සායනවල කාර්ය සාධනය.

පෙර වසරේ සායන වල සාමාන්‍ය කටයුතු ද වසංගත තත්ත්වය නිසා අඩාල වී පැවති බැවින් සහා පොදු ප්‍රවාහන ක්ෂේත්‍රයේ අපහසුතා නිසා රජයේ හෝමියෝපති සායන වල දිනකට පරීක්ෂා කරන රෝගීන්ගේ සංඛ්‍යාව අඩු වීම මෙම වසරේ ක්‍රමානුකූලව සාමාන්‍ය තත්ත්වයකට පත් විය.

හෝමියෝපති වෛද්‍ය සභාව මඟින් මෙහෙයවනු ලබන රජයේ හෝමියෝපති සායන 13 මඟින් මෙම වසර තුළ පසුගිය වසරට වඩා ප්‍රතිකාර ගත් රෝගීන් ප්‍රමාණ පහත පරිදි වැඩිවීමක් සිදු වී ඇත.

| අනු අංක | සායනය | ප්‍රතිකාර ගත් රෝගීන් සංඛ්‍යාව |
|---|---|---|
| 1 | දෙහිවල | 4,416 |
| 2 | තෝලංගමුව | 5,456 |
| 3 | පරකඩුව | 4,279 |
| 4 | කුරුණෑගල | 12,002 |
| 5 | කොත්මලේ | 3,849 |
| 6 | මොණරාගල | 4,405 |
| 7 | පාලමුණෙ | 6,835 |
| 8 | පුත්තලම | 3,921 |
| 9 | මාතලේ | 6,989 |
| 10 | අම්බලන්තොට | 2,305 |
| 11 | මඩකලපුව | 3,022 |
| 12 | ඉංගිරිය | 2,155 |
| 13 | රත්ගම | 9,325 |
| | **එකතුව** | **68,959** |

### 9.1.2 රජයේ හෝමියෝපති සායන කළමනාකරණය.

රජයේ හෝමියෝපති සායන කළමනාකරණය කරනු ලබන්නේ හෝමියෝපති වෛද්‍ය සභාව විසිනි. ඒ අනුව 2022 වසර පුරා ද ඒ වෙනුවෙන් ක්‍රියා කරන ලද අතර ඒ යටතේ සේවක වැටුප් හා දීමනා ලබා දීම, ආයතන වල කාර්ය මණ්ඩල පරිපාලනය, සායන වලට ජලය, විදුලිය හා සනීපාරක්ෂක සේවා සැපයීම, සායන උපකරණ, බෙහෙත් හා කාර්යාල උපකරණ ලබා දීම පමණක් නොව ගොඩනැගිලි නඩත්තුව සඳහා ද ක්‍රියා කරනු ලැබේ.

සායන සඳහා ලබා දීමට ඇනවුම් කර තිබූ බෙහෙත් තොග හා ඖෂධ බහාලුම් පසුගිය වසරේ ලැබී තිබූ නමුත් රටෙහි පැවති තත්ත්වය නිසා එම වසරේ බෙදා හැරීමට නොහැකි වීම නිසා මෙම වසර අග භාගයේ දී එය සිදු කළ හැකි විය. තව ද මෙම වසරේ පෙබරවාරි මාසයේ කලින් ඇනවුම් කර තිබූ ඖෂධ බහාලුම් කවර තොග ද ලැබීම නිසා සායන වෙත ඒවා කඩිනමින් ලබා දීමට අවශ්‍ය කටයුතු කිරීමට උත්සාහ කළ නමුත් එම සේවාවන් සැපයීමේදී යම් යම් ගැටළුකාරී තත්ත්වයන්ට මුහුණදීමට සිදු විය.

ඊට හේතු පාදක වූයේ 2022 වර්ෂය තුළ පැවැති ඉන්ධන අර්බුදය හමුවේ එම සායන සඳහා නියමිත දිනට අදාළ ඖෂධ හා ඖෂධ බහාලන කුප්පි සහ කවර මෙන්ම එම සායනයන්හි සනීපාරක්ෂක කටයුතු සඳහා ඊට අදාළ ද්‍රව්‍ය ලබාදීමට නොහැකි වීම වේ. එයින් ඇතිවූ බලපෑමක් ලෙස සායනයන්හි රෝගීන් සඳහා ප්‍රතිකාර කිරීමේ කටයුතු මද පසුබෑමකට ලක්විය. එමෙන්ම පවත්වාගෙන යනු ලබන 13ක් පමණ වන සායන සඳහා අවශ්‍ය යන්ත්‍ර උපකරණ ලබාගැනීම සඳහා ප්‍රතිපාදන වෙන්ව නොතිබීම හේතුවෙන් එම සායනයන්හි කටයුතු සිදුකිරීමේ දී යම් යම් අපහසුතාවයනට මුහුණදීමට සිදු වී ඇත. එමෙන්ම, ආරම්භ කිරීමට යෝජිත පොළොන්නරුව නව සායනය පිළිබඳ සහ හෝමියෝපති වෛද්‍ය ක්‍රමය සංවර්ධනය පිළිබඳ අතිගරු සෞඛ්‍ය ආමාත්‍යතුමා සමඟ මේ සඳහා කළ යුතු ඉදිරි වැඩ කටයුතු වෙනුවෙන් ද සාකච්ඡා පවත් වන ලදී.

## 9.2 හෝමියෝපති සම්මන්ත්‍රණ හා ජංගම සායන පැවැත්වීම

හෝමියෝපති වෛද්‍ය ක්‍රමය මහජනයා අතර ප්‍රචලිත කිරීමේ අරමුණින් සංවිධානය කෙරෙන හෝමියෝපති සම්මන්ත්‍රණ හා ජංගම සායන පැවැත්වීම හෝමියෝපති වෛද්‍ය සභාව වාර්ෂිකව සිදු කරන ප්‍රධාන කාර්යයක් වේ.

හෝමියෝපති වෛද්‍ය ක්‍රමය මහජනයා අතර ප්‍රචලිත කිරීමේ අරමුණින් සංවිධානය කෙරෙන හෝමියෝපති සම්මන්ත්‍රණ හා ජංගම සායන පැවැත්වීම හෝමියෝපති වෛද්‍ය සභාව වාර්ෂිකව සිදු කරන ප්‍රධාන කාර්යයක් වේ. ඩොලර් අර්බුදය හමුවේ ඇති වූ ඖෂධ හිඟය සහ රටෙහි පැවති අස්ථාවරත්වය නිසා මෙම වසරේදී ජංගම සායන හා සම්මන්ත්‍රණ පැවැත්වීම සිදු කෙරුනේ ඉතාමත් අල්ප වශයෙන් බව සඳහන් කිරීම අත්‍යාවශ්‍යවේ. මේ අනුව පහත සඳහන් සම්මන්ත්‍රණ හා ජංගම සායන රජයේ හෝමියෝපති සායන හා එක්ව අමාත්‍යංශය අනුග්‍රහයෙන් සහ මෙහෙයවීමෙන් පවත්වන ලදී.

## 2022 වර්ෂය තුළ පවත්වන ලද ජංගම සායනයන්

| අංක | මෙහෙය වීම | ස්ථානය | දිනය | වැඩසටහන |
|---|---|---|---|---|
| 01 | හෝමියෝපති වෛද්‍ය සභාව විසින් අමාත්‍යාංශයේ මෙහෙයවීමෙන් පවත්වන ලදි | අහුගම්මන ශ්‍රී සුදර්ශනාරාම විහාරය | 2022.01.17 | හෝමියෝපති වෛද්‍ය ක්‍රමය පිළිබඳව මහජනතාවව දැනුවත් කිරීම හා ප්‍රතිකාර කිරීම. පැමිණි රෝගීන් සංඛ්‍යාව 60කි. |
| 02 | හෝමියෝපති වෛද්‍ය සභාව විසින් අමාත්‍යාංශයේ මෙහෙයවීමෙන් පවත්වන ලදී | හංවැල්ල දිද්දෙණිය කොළොන්කන්ද විහාරය | 2022.02.16 | හෝමියෝපති වෛද්‍ය ක්‍රමය පිළිබඳව මහජනතාවව දැනුවත් කිරීම හා ප්‍රතිකාර කිරීම පැමිණි . රෝගීන් සංඛ්‍යාව 50කි. |
| 03 | හෝමියෝපති වෛද්‍ය සභාව විසින් | ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරිශ්‍රය | 2022.02.24 | හෝමියෝපති වෛද්‍ය ක්‍රමය පිළිබඳව මහජනතාවව දැනුවත් කිරීම හා ප්‍රතිකාර කිරීම පැමිණි . රෝගීන් සංඛ්‍යාව 87කි. |
| 04 | හෝමියෝපති වෛද්‍ය සභාව විසින් | අල්ලියවත්ත ග්‍රාම නිලධාරී කාර්යාල පරිශ්‍රය | 2022.02.28 | හෝමියෝපති වෛද්‍ය ක්‍රමය පිළිබඳව මහජනතාවව දැනුවත් කිරීම හා ප්‍රතිකාර කිරීම පැමිණි . රෝගීන් සංඛ්‍යාව 74කි. |
| 05 | පුත්තලම රජයේ හෝමියෝපති සායනය | පුත්තලම ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරිශ්‍රය | 2022.03.08 | හෝමියෝපති වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීම සඳහා පැමිණි රෝගීන් සංඛ්‍යාව 83කි. |
| 06 | පුත්තලම රජයේ හෝමියෝපති සායනය | UC ක්‍රීඩාගාර පරිශ්‍රය | 2022.03.12 | හෝමියෝපති වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීම සඳහා පැමිණි රෝගීන් සංඛ්‍යාව 152කි. |
| 07 | මොණරාගල රජයේ හෝමියෝපති සායනය | ප්‍රජා ශක්ති මධ්‍යස්ථානය පස්සර | 2022.03.12 | හෝමියෝපති වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීම සඳහා පැමිණි රෝගීන් සංඛ්‍යාව 53 කි. |
| 08 | කොත්මලේ රජයේ හෝමියෝපති සායනය | ඉබ්බන්වැව ශ්‍රී සුදර්ශනාරාම විහාරස්ථානය | 2022.03.17 | හෝමියෝපති වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීම සඳහා පැමිණි රෝගීන් සංඛ්‍යාව 59 කි. |
| 09 | ඉංගිරිය රජයේ හෝමියෝපති සායනය | හොරණ රජමහා විහාරස්ථානය | 2022.03.17 | හෝමියෝපති වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීම සඳහා පැමිණි රෝගීන් සංඛ්‍යාව .කි 83 |

| | | | | |
|---|---|---|---|---|
| 10 | පරකඩුව රජයේ හෝමියෝපති සායනය | හිදැල්ලන අක්කර 100 විමලාරාම බෞද්ධ මධ්‍යස්ථානය | 2022.03.17 | හෝමියෝපති වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීම සඳහා පැමිණි රෝගීන් සංඛ්‍යාව 44 කි. |
| 11 | මාතලේ රජයේ හෝමියෝපති සායනය | පවුල් සෞඛ්‍ය සේවා නිලධාරී කාර්යාලය, මාතලේ | 2022.03.25 | හෝමියෝපති වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීම සඳහා පැමිණි රෝගීන් සංඛ්‍යාව 27 කි. |
| 12 | අම්බලන්තොට රජයේ හෝමියෝපති සායනය | සූරියවැව, මීගහපැදුර ප්‍රජා ශාලාව | 2022.03.29 | හෝමියෝපති වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීම සඳහා පැමිණි රෝගීන් සංඛ්‍යාව 51 කි. |
| 13 | තෝලංගමුව රජයේ හෝමියෝපති සායනය | තෝලංගමුව ප්‍රජා ශාලාව | 2022.03.31 | හෝමියෝපති වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීම සඳහා පැමිණි රෝගීන් සංඛ්‍යාව 45 කි. |
| 14 | දෙහිවල රජයේ හෝමියෝපති සායනය | පින්වත්ත මහා විහාරය | 2022.04.01 | හෝමියෝපති වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීම සඳහා පැමිණි රෝගීන් සංඛ්‍යාව 40 කි. |
| 15 | කොත්මලේ රජයේ හෝමියෝපති සායනය | උලපනේ, ශ්‍රී සුදර්මාරාමය මහා විහාරය | 2022.11.11 | හෝමියෝපති වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීම සඳහා පැමිණි රෝගීන් සංඛ්‍යාව 52 කි. |
| 16 | ඉංගිරිය රජයේ හෝමියෝපති සායනය | වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඇලපිටිවල ශ්‍රී සද්ධර්මාරාම විහාරස්ථානය | 2022.11.16 | හෝමියෝපති වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීම සඳහා පැමිණි රෝගීන් සංඛ්‍යාව 23 කි. |
| 17 | කොත්මලේ රජයේ හෝමියෝපති සායනය | ඉහලගම, ආනන්ද ප්‍රජා ශාලාව | 2022.12.16 | හෝමියෝපති වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීම සඳහා පැමිණි රෝගීන් සංඛ්‍යාව 119 කි. |

## 9.3 වෛද්‍ය සභාව වෙත නව නිලධාරීන් අනුයුක්ත කිරීම.

2016 අංක 10 දරණ නව හෝමියෝපති පණතේ 18 (1) (අ) වගන්තියට අනුව සභාවේ සිටි ලේඛකාධිකාරී වරයාගේ ධූර කාලය 2021.11.04 දින අවසන් වීම නිසා 2021.10.29 දින පැවති එකළොස් වන වෛද්‍ය සභා රැස්වීමේ දී එය තීරණය කරන ලද අතර එම තීරණයට අනුව ලේඛකාධිකාරී වරයාගේ ධූර කාලය නිමා විය. එබැවින් එදින සිට පුරප්පාඩුව පැවති වෛද්‍ය සභා කාර්යාලයේ ලේඛකාධිකාරී තනතුර සඳහා 2022.02.07 දින සිට නව ලේඛකාධිකාරීවරියක් පත් කරන ලදී. තව ද, පුරප්පාඩුව පවතින වෛද්‍ය නිලධාරී තනතුරක් සඳහා හෝමියෝපති උපාධිධාරී වෛද්‍යවරයෙක් මෙම වසරේ දී (2022.02.01 දින) බඳවා ගන්නා ලද අතරම සභා කාර්යාලයේ 2018 වර්ෂයේ සිට පැවති කළමනාකරණ සහකාර තනතුර සඳහා ද 2022.08.03 දින නිළධාරිනියක් බඳවා ගැනීමට කටයුතු කරන ලදී.

## 9.4හෝමියෝපති උපාධිධාරී වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම.

මේ අනුව 2022 වර්ෂය සඳහා හෝමියෝපති උපාධිධාරී වෛද්‍යවරුන් 07 දෙනෙකු ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කර තිබූ අතර එම වෛද්‍යවරුන් වෛද්‍ය සභාවේ සාමාන්‍ය ලේඛනයේ හෝමියෝපති වෛද්‍යවරුන් ලෙස ලියාපදිංචි කරන ලදී. මේ අනුව මෙරට ලියාපදිංචිය හෝමියෝපති වෛද්‍යවරුන් සංඛ්‍යාව 315 දක්වා වර්ධනය විය.

## 9.5 හෝමියෝපති ඖෂධ ආනයනය සඳහා නිර්දේශ ලබා දීම.

2022 වර්ෂයේ හෝමියෝපති ඖෂධ ආනයනය සඳහා වෛද්‍යවරුන් සහ ආයතන වෙත ඇමරිකානු ඩොලර් 78,560.04ක් වටිනා ආනයන බලපත්‍ර 15 ක් සඳහා තාක්ෂණික කමිටුවේ නිර්දේශ ලබා දී ඇත.

| | |
|---|---|
| 01. වෛද්‍ය ජී.හෆීසා බෙගම් (09.02.2022) | - $3,876.92 |
| 02. වෛද්‍ය එස්.ඩී.පී.පෙරේරා (06.04.2022) | - $ 686.00 |
| 03. වෛද්‍ය ජී.ටී.ලියනආරච්චි (27.04.2022) | - $6,143.06 |
| 04. වෛද්‍ය එස්.ජී.හරිනි (17.05.2022) | - $4,323.22 |
| 05. වෛද්‍ය එම්.එම්.ජේ.එස්.මධුෂාන් (17.05.2022) | - $3,268.00 |

| | |
|---|---|
| 06. වෛද්‍ය බී.ඒ.ඩී.අයි.වීරසිංහ | - $5,960.72 |
| (01.08.2022) | |
| 07. වෛද්‍ය ඊ.එම්.ටී.ඩී.බී.ඒකනායක | - $5,279.31 |
| (01.08.2022) | |
| 08. වෛද්‍ය ඊ.එම්.ටී.ඩී.බී.ඒකනායක | - $3,303.24 |
| (01.08.2022) | |
| 09. වෛද්‍ය එස්.ජී.හරිනි | - $5,777.00 |
| (09.09.2022) | |
| 10. වෛද්‍ය එස්.ජී.හරිනි | - $6,059.67 |
| (09.09.2022) | |
| 11. State Pharmaceuticals Corporation of Sri Lanka | - $17,520.60 |
| (21.09.2022) | |
| 12. වෛද්‍ය ඩී.බී.එස්.ආර්.කේ. විට්ටහච්චි | - $5,520.00 |
| (23.11.2022) | |
| 13. වෛද්‍ය ඩී.බී.එස්.ආර්.කේ. විට්ටහච්චි | - $7,361.50 |
| (23.11.2022) | |
| 14. වෛද්‍ය එස්.ඩී.පී.පෙරේරා | - $383.83 |
| (29.11.2022) | |
| 15. වෛද්‍ය ජී.හෆීසා බෙගම් | - $3,096.97 |
| (30.12.2022) | |
| **එකතුව** | **- $78,560.04** |

## 9.6 නව සායන ආරම්භ කිරීම.

නව පොළොන්නරුව සායනය නිරීක්ෂණය කිරීම සඳහා හෝමියෝපති වෛද්‍ය සභාවේ සභාපතිතුමා සහ උප සභාපතිතුමා සහභාගී වූ අතර එම සායනය භාවිතා කළ හැකි පරිදි සාදා නිම කර ඇති බවට වාර්තා කරන ලදී.

## 9.7 හෝමියෝපති වෛද්‍ය සභාවේ නිල වෙබ් අඩවිය සහ හෝමියෝපති රෝහල් පරිශ්‍රයේ නිර්මාණය කර තිබූ හනිමාන් පිළිරුව ආශ්‍රිතව ඉදිකළ දිය ඇල්ල විවෘත කිරීම.

2022.12.02 දින දේශීය වෛද්‍ය අමාත්‍ය ගරු සිසිර ජයකොඩි මැතිතුමාගේ මූලිකත්වයෙන් **www.slhmc.lk** යන නිල වෙබ් අඩවිය විවෘත කරන ලදී. එමගින් ලියාපදිංචි හෝමියෝපති වෛද්‍යවරුන්ද යන වග සහ වෛද්‍ය සභාවේ නව තොරතුරු සහ තීරණ දැනගැනීමට හැකියාව ඇත. එසේම හෝමියෝපති රෝහල් පරිශ්‍රයේ නිර්මාණය කර තිබූ හනිමාන් පිළිරුව සහ පොකුණ නැවත අලුත්වැඩියා කර එය අසළ දිය ඇල්ලක් ඉදි කරන ලද අතර එය එදින විවෘත කරන ලදී.

## 9.8 2016 අංක 10 දරණ හෝමියෝපති පනතේ 30(1) වගන්තිය ප්‍රකාරව විභාගය පැවැත්වීම සඳහා වැඩමුළු සංවිධානය කිරීම.

2016 අංක 10 දරණ හෝමියෝපති පනතේ 30(1) වගන්තිය ප්‍රකාරව විභාගය පැවැත්වීම සඳහා **Zoom** තාක්ෂණය ඔස්සේ උපකාරක වැඩමුළු 05ක් ද විභාග අපේක්ෂකයන් දැඩි ඉල්ලීම මත ප්‍රායෝගික සම්මන්ත්‍රණ 2ක් ද ඉතාමත් සාර්ථක ලෙස හෝමියෝපති වෛද්‍ය සභාව විසින් සංවිධානය කල අතර ඒ සඳහා විභාග අපේක්ෂකයන් විශාල පිරිසක් සහභාගී විය.

# 10. වාර්ෂික ගිණුම් වාර්තා

## හෝමියෝපති වෛද්‍ය සභාව

## 2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අවසාන ගිණුම්

අන්තර්ගතය

- ❖ ගිණුම්කරණ ප්‍රතිපත්ති
- ❖ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය හා පාදක සටහන් ( 1 සිට 4 දක්වා )
- ❖ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය හා පාදක සටහන් ( 1 සිට 4 දක්වා )
- ❖ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශය හා පාදක සටහන් ( 1 සිට 3 දක්වා )
- ❖ 2022 දෙසැම්බර් 31 දිනට ස්කන්ධය වෙනස් වීමේ වාර්තාව
- ❖ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පිරික්සුම

## ගිණුම්කරන ප්‍රතිපත්ති

**ගිණුම් ඉදිරිපත් කිරීම.**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් කරන ප්‍රමිති (2009) අංක 01ට අනුවය. එසේම එහි "ස්වභාවය මතවියදම් වර්ගීකරණය විදහා පෑම" යන පරිදී ඉදිරිපත් කර ඇත. හෝමියෝපති වෛද්‍ය සභාවේ පුනරාවර්තන හා මූලධන වියදම් සඳහා රජයෙන් ලැබුනු ප්‍රතිපාදනයන්ගෙන් සභාවට ලද ප්‍රදානයක් ලෙසත් එසේම එම ප්‍රධානයන්ගෙන් දරනු ලැබූ වියදම් සභාවේ වියදම් ලෙසත්

**ක්ෂය සඳහා වෙන් කිරීම.**

සෑම ස්ථාවර වත්කමක්ම ක්ෂය කර ඇත්තේ හීනවන ශේෂ ක්‍රමය පදනම් කරගෙන වේ.

2022 දෙසැම්බර් 31 දින දක්වා සෑම වත්කමක්ම ක්ෂය කර ඇත්තේ 12% ක ක්ෂය අනුපාතයකට වේ.

ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිති අංක 7(24) පරිදී වත්කම්හි පිරිවැය මත ගිණුම්ගත කර ඇත.

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 හි 69 ඡේදය ප්‍රකාරව, එනම් සභාවේ වත්කම් ක්ෂය කරනු ලබනුයේ වත්කම් පාවිච්චි කිරීමට සූදානම් කිරීමෙන් පසුවය. එසේම වත්කම් පොත් වලින් ඉවත් කල යුතු යැයි හඳුනා ගැනීමෙන් පසුව එම වත්කම සඳහා ක්ෂය කිරීමක් නොකිරීමටද කටයුතු කරනු ඇත.

**පාරිතෝෂිත සඳහා වෙන් කිරීම**

1983 අංක 12 දරණ පාරිතෝෂිත ගෙවීමේ පනත අනුව වර්ෂ පහකට වැඩි සේවා කාලයක් ඇති නිලධාරීන් පාරිතෝෂිත ගෙවීම සඳහා සුදුසුකම් ලබන බැවින් පනතේ සඳහන් පරිදී වසර පහකට වඩා වැඩි සේවා කාලයක් ඇති නිලධාරීන් සඳහා පමණක් පාරිතෝෂිත සඳහා වෙන් කරනු ලැබ ඇත. ඒ අනුව, 2022 වර්ෂයේ එවැනි සුදුසුකම් ලැබූ නිලධාරීන්/ සේවකයින් 17 දෙනෙකු වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් කරනු ලැබ ඇත.

## හෝමියෝපති වෛද්‍ය සභාව

## 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය

| | සටහන් | 2022 | 2021 |
|---|---|---|---|
| | | රු | රු |
| වත්කම | | | |
| ජංගම වත්කම | | | |
| මුදල් හා මුදල් සමාන දෑ | 1 | 3,450,334.05 | 2,681,040.00 |
| ඖෂධ බහාලුම තෝග ගිණුම | | 384,731.00 | 384,731.00 |
| ජංගම නොවන වත්කම | | | |
| පිරියත උපකරණ | 2 | 3,716,288.20 | 4,057,941.00 |
| ගොඩනැගිලි පුනුරුත්තාපනය | | 7,547,721.00 | 6,341,215.00 |
| වෙනත් උපකරණ | | 1,450.00 | 1,450.00 |
| | | 11,265,459.20 | 10,400,606.00 |
| මුළු වත්කම | | 15,100,524.25 | 13,466,377.00 |
| බැරකම | | | |
| ජංගම බැරකම | 3 | 3,700,094.04 | 2,966,726.00 |
| ජංගම නොවන බැරකම | | | |
| මුළු බැරකම | | 3,700,094.04 | 2,966,726.00 |
| ශුද්ධ වත්කම | | 11,400,430.21 | 10,499,651.00 |
| ශුද්ධ වත්කම / ස්කන්ධය | | | |
| ප්‍රාග්ධනය | | 2,562,144.00 | 2,562,144.00 |
| රජයේ ප්‍රාග්ධන ප්‍රතිපාදන(සංචිත) | | 11,160,321.00 | 11,160,321.00 |
| සමුච්චිත ඌනතා / අතිරික්තතා | 4 | (2,322,034.79) | (3,192,398.00) |
| පෙර වර්ෂයේ ගැලපුම ගිණුම | | | (30,416.00) |
| | | 11,400,430.21 | 10,499,651.00 |

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ සහ ඉදිරිපත් කිරිමේ වගකීම හෝමියෝපති වෛද්‍ය සභාව විසින් දරණ බව සහතික කරමු

..........................
ලේඛකාධිකාරි
හෝමියෝපති
වෛද්‍ය සභාව

..........................
සභාපති
හෝමියෝපති
වෛද්‍ය සභාව

..........................
කමිටු සමාජික
හෝමියෝපති
වෛද්‍ය සභාව

..........................
සකස් කළේ
ගණකාධිකාරි
T.M.J. තෙන්නකෝන්

ASSOCIATES
Accountants
Auditors
Main Street, Veyangoda

**Registrar**
Homoeopathic Medical Council
No. 94, Welisara
Kagama.

හෝමියෝපති වෛද්‍ය සභාව

## 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සටහන්

| | සටහන් | 2022 | 2021 |
|---|---|---|---|
| | | රු | රු |
| **සටහන 01** | | | |
| මුදල් හා මුදලට සමාන දෑ | | | |
| කොමර්ෂල් බැංකුව | | 2,094,192.72 | 2,022,267.00 |
| ලංකා බැංකුව | | 1,102,787.83 | 462,873.00 |
| මහජන බැංකුව | | 251,100.00 | 195,900.00 |
| සුළු මුදල් | | 2,253.50 | |
| | | 3,450,334.05 | 2,681,040.00 |
| **සටහන 02** | | | |
| පිරියත උපකරණ | | | |
| පිරියත උපකරණ( ගත්මිල) | | 6,669,503.00 | 6,524,203.00 |
| අඩුකලා | | | |
| සමුච්චිත ක්ෂය | | (2,953,214.80) | (2,466,262.00) |
| ශුද්ධ අගය | | 3,716,288.20 | 4,057,941.00 |
| **සටහන 03** | | | |
| ගෙවිය යුතු දෑ | | | |
| ගෙවිය යුතු විගණන ගාස්තු | | 195,620.00 | 97,810.00 |
| ගෙවිය යුතු ගණකාධිකාරී ගාස්තු | | 150,000.00 | 50,000.00 |
| ගෙවිය යුතු දුරකතන ගාස්තු | | 7,243.28 | 4,171.00 |
| ගෙවිය යුතු විදුලිය | | 16,544.56 | 2,192.00 |
| ගෙවිය යුතු ජලය | | 6,943.70 | 14,305.00 |
| පාරිතෝෂිත වෙන්කිරීම | | 3,091,142.50 | 2,542,908.00 |
| ගෙවිය යුතු ගමන් වියදම් | | - | 35,725.00 |
| ගෙවිය යුතු සායන වියදම් | | 54,935.00 | 10,585.00 |
| ගෙවිය යුතු වරිපනම් | | 2,000.00 | 2,000.00 |
| ගෙවිය යුතු දැන්වීම් ගාස්තු | | | 132,030.00 |
| ගෙවිය යුතු සභාපති දීමනා | | 75,000.00 | 75,000.00 |
| ගෙවිය යුතු භාෂා පරිවර්තන ගාස්තු | | 100,665.00 | - |
| | | 3,700,094.04 | 2,966,726.00 |
| **සටහන 04** | | | |
| සමුච්චිත ඌනතා / අතිරික්තතා 2021.01.01 | | (3,192,398.00) | (2,688,452.00) |
| එකතුකලා 2021 වර්ෂයේ ගැලපීම් | | (30,416.00) | (191,365.00) |
| | | (3,222,814.00) | (2,879,817.00) |
| එකතුකලා | | | |
| 2022 වර්ෂයේ කාර්ය සාධනයේ ඌනතා / අතිරික්තතා | | 900,779.21 | (312,581.00) |
| | | (2,322,034.79) | (3,192,398.00) |

**සටහන - 05**
ගිණුම් ඉදිරිපත් කිරීම
ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් කරන ප්‍රමිති (2009) අංක 01ට අනුවය.

**සටහන - 06**
සෑම ස්ථාවර වත්කමක්ම ක්ෂය කර ඇත්තේ හීනවන ශේෂ ක්‍රමය පදනම් කරගෙන වේ.
2022 දෙසැම්බර් 31 දක්වා සෑම වත්කමක්ම ක්ෂය කර ඇත්තේ 12% ක ක්ෂය අනුපාතයකට වේ.
ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිති අංක 7(24) පරිදි වත්කම්හි පිරිවැය මත ගිණුම්ගත කර ඇත.
ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 හි 69 ඡේදය ප්‍රකාරව එනම් සභාවේ වත්කම් ක්ෂය කරනු ලබනුයේ වත්කම් පාවිච්චි කිරීමට සූදානම් කිරීමෙන් පසුවය. එසේම,වත්කමක් පොත්වලින් ඉවත් කළ යුතු යැයි හඳුනා ගැනීමෙන් පසුව එම එම වත්කම සඳහා ක්ෂය කිරීමක් නොකිරීමටද කටයුතු කරනු ඇත.

**සටහන - 07**
2022 වර්ෂය සඳහා විගණන ගාස්තු වෙන්කර ඇත.

**සටහන - 08**
හෝමියෝපති වෛද්‍ය සභාවේ පුනරාවර්ථන හා මූලධන වියදම් සඳහා රජයෙන් ලැබුනු ප්‍රතිපාදනයන් සභාවට ලැබුණු ප්‍රතිපාදනයන් ලෙසත් එසේම එම ප්‍රතිපාදනයන් ගෙන් දරණු ලැබූ වියදම් සභාවේ වියදම් ලෙසත් සලකා අවසන් ගිණුම පිළියෙල කර ඇත.

**සටහන - 09**
1983 අංක 12 දරණ පාරිතෝෂිත ගෙවීමේ පනතට අනුව වර්ෂ පහකට වැඩි සේවා කාලයක් ඇති නිලධාරීන් පාරිතෝෂිත ගෙවීම සඳහා සුදුසුකම් ලබන අතර ඒ අනුව 2022 වර්ෂය සඳහා එවැනි සුදුසුකම් ලැබූ නිලධාරීන්/සේවකයින් 17 දෙනෙකු වෙනුවෙන් ප්‍රතිපාදන වෙන්කරනු ලැබ ඇත.

**සටහන - 10**
මේ වන විට හෝමියෝපති වෛද්‍ය සභාවට එරෙහිව ගරු අධිකරණයේ නඩු 06ක් විභාග වෙමින් පවතී.

(i) 7087/11/m අංක දරණ හෝමියෝපති වෛද්‍ය සභාව සහ එහි සාමාජිකයින් 06 දෙනෙකු විත්තිකරුවන් කරමින් වෛද්‍ය නිමල්ගාමිණී විජේතුංග විසින් පවරා ඇති නඩුව, දෙහිවල සායනයේ ගරු සේවයේ යෙදෙමින් කටයුතු කල ඔහුව සේවයෙන් ඉවත් කිරීමට එරෙහිව රුපියල් මිලියන තුනක් ඉල්ලා පවරනු ලැබ ඇති මෙම නඩුව ගල්කිස්ස දිසා අධිකරණයේ විභාග වෙමින් පවතී.

(ii) 13953/m අංක දරණ හෝමියෝපති වෛද්‍ය සභාවේ සේවයේ නියුත්ව සිටි (ස්ථිර පදනමින් නොවන) M.R.D.සේරම් යන අය සේවයෙන් ඉවත් කිරීමට එරෙහිව රුපියල් මිලියන දෙකක වන්දියක් ඉල්ලා මීගමුව දිසා අධිකරණයේ මෙම නඩුව පවරා ඇත. මෙය තවදුරටත් විභාග වෙමින් පවතී.

(iii) 51/52/2010 අංක දරණ වත්තල කම්කරු විනිශ්වය සභාවේ පනවා ඇති නඩුව, 13953/m අංක දරණ නඩුවේ පැමිණිලිකරු විසින්ම එම නඩු නිමිත්ත මතම මෙම නඩුවද පවරා තිබුණි. මෙම පැමිණිලිකරුට හිඟ වැටුප් ගෙවමින් ඔහු පෙර සේවය කළ තනතුරේම පිහිටුවා සේවය කරන ලෙස තීන්දුව ලබා දෙන ලදී.

iv. 14318 - m මීගමු දිසා අධිකරණය 2009 වසරේ එතෙක් පැවති වෛද්‍ය විසුරුවාහැරීමෙන් පසුව පත් කරනු ලේඛකාධිකාරී සහ සිදු කෙරෙනු ලියාපදිංචි කිරීමේ බල රහිත කරන ලෙස ඉල්ලා මෙම නඩුව පවරා ඇත්තේ වෛද්‍ය S.D.P.පෙරේරා මයා ය.

v. හෝමියෝපති අතුරුපාලක කමිටුවට වෛද්‍ය සභාවේ බලතල ක්‍රියාත්මක කිරීම අත්හිටුවන ලෙස නියෝගයක් ලබා දෙන ලෙස ඉල්ලා පැවරූ නඩුවේ තීන්දුව ගරු අභියාචනාධිකරණය විසින් ලබා දුනි. එමගින් හෝමියෝපති අතුරු පාලක කමිටුව පත් කිරීම කැබිනට් අනුමැතියේ නියමයන්ට අනුකූලව සිදුකර නොමැති බව දක්වමින් ගරු අභියාචනාධිකරණය හෝමියෝපති අතුරුපාලක කමිටුවේ සියලු තීරණ අවලංගු කිරීමට නියෝග කර තිබුණි.

මෙම නඩුවේ තීන්දුවට අදාළ ලියකියවිලි වල ඇතුලත් සියලු කරුණු සැලකිල්ලට නොගැනීමමත ලබා දී ඇති එකක් බවට දක්වමින් එයට එරෙහි තීන්දුවක් ඉල්ලා ගරු ශ්‍රේෂ්ඨාධිකරණයට අමාත්‍යාංශය මගින් කර තිබූ අභියාචනය විභාගයට ගෙන ගරු ශ්‍රේෂ්ඨාධිකරණය විසින් අතුරු වෛද්‍ය සභා වලින් කර තිබූ වෛද්‍යවරයන්ගේ කිසිදු ලියාපදිංචියක් අහෝසි නොවන බවට සහතික කරමින් ගරු ශ්‍රේෂ්ඨාධිකරණය මගින් තීන්දුව ලබා දෙන ලදී. නඩු අංකය Sc/FR/A/3902021 ශ්‍රේෂ්ඨාධිකරණය.

හෝමියෝපති වෛද්‍ය සභාව

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

## මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

| | සටහන් | 2022 | 2021 |
|---|---|---|---|
| | | රු | රු |
| අයභාරය | | | |
| රජයේ පුනරාවර්තන ප්‍රතිපාදන | | 34,807,958.15 | 24,429,201.00 |
| වෙනත් අයභාර | 1 | 3,244,845.00 | 10,200.00 |
| බැංකු පොලි | | 77,937.11 | 69,460.00 |
| මුළු අයභාරය | | 38,130,740.26 | 24,508,861.00 |
| වියදම | | | |
| වැටුප් වේතන හා සේවක පතිලාභ | 2 | 29,674,689.03 | 21,196,793.00 |
| සැපයුම් හා පාරිභෝගික ද්‍රව්‍ය | 3 | 182,374.50 | 57,413.00 |
| ක්ෂය හා ක්‍රම ක්ෂය | | 486,952.80 | 302,694.00 |
| වෙනත් වියදම් | 4 | 6,885,944.72 | 3,264,192.00 |
| මූල්‍ය පිරිවැය( බැංකු ගාස්තු) | | | 350.00 |
| මුළු වියදම | | 37,229,961.05 | 24,821,442.00 |
| කාලච්ඡේදය සඳහා ඌනතාවය/අතිරික්තය | | 900,779.21 | (312,581.00) |

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම හෝමියෝපති වෛද්‍ය සභාව විසින් දරණ බව සහතික කරමු

| | | | |
|---|---|---|---|
| ................... | ................... | ................... | ................... |
| ලේඛකාධිකාරී | සභාපති | කමිටු සමාජික | සකස් කළේ |
| හෝමියෝපති | හෝමියෝපති | හෝමියෝපති | ගණකාධිකාරී |
| වෛද්‍ය සභාව | වෛද්‍ය සභාව | වෛද්‍ය සභාව | T.M.J. තෙන්නකෝන් |

Registrar
Homoeopathic Medical Council
No. 94, Welisara,
Ragama.

Dr.D.M.Ashan Thilanka
President
Homoeopathic Medical Council

හෝමියෝපති වෛද්‍ය සභාව

## 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සටහන්

| | සටහන් | 2022 | 2021 |
|---|---|---|---|
| | | රු | රු |
| සටහන 01 | | | |
| වෙනත් අයභාර | | | |
| වාර්ෂික ගාස්තු | | 30,950.00 | 5,200.00 |
| පරිත්‍යාග (Bodi Clinic) | | 605,245.00 | - |
| වාහන බලපත්‍ර | | 103,500.00 | - |
| ඩිප්ලෝමා ඇතුලත්වීමේ ගාස්තු | | 20,000.00 | - |
| වෛද්‍යවරුන්ගේ සුහද හමුව | | 345,000.00 | - |
| විභාග ගාස්තු | | 728,000.00 | - |
| හැඳුනුම්පත් ගාස්තු | | 95,750.00 | - |
| ඇතුලත්වීමේ ගාස්තු | | 67,900.00 | - |
| වැඩමුළු සඳහා ලැබීම | | 1,234,000.00 | - |
| වෛද්‍ය වාර්ත පොත් | | 8,000.00 | - |
| විවිධ ලැබීම | | 6,500.00 | 5,000.00 |
| | | 3,244,845.00 | 10,200.00 |
| සටහන 02 | | | |
| වැටුප් වේතන හා සේවක ප්‍රතිලාභ | | | |
| කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා | | 26,476,627.31 | 18, 424,041 |
| සේවක අර්ථසාධක අරමුදල් | | 2,550,604.53 | 2,218,202.00 |
| සේවා නියුක්ති භාර අරමුදල් | | 647,457.19 | 554,550.00 |
| | | 29,674,689.03 | 2,772,752.00 |
| සටහන 03 | | | |
| සැපයුම් හා පරිභෝජන ද්‍රව්‍ය | | | |
| ලිපි ද්‍රව්‍ය වියදම් | | 25,155.00 | 19,739.00 |
| සංග්‍රහ වියදම් | | 157,219.50 | 35,748.00 |
| ඖෂධ බහාලුම් හා ඖෂධ බහාලුම් | | - | 1,926.00 |
| | | 182,374.50 | 57,413.00 |

හෝමියෝපති වෛද්‍ය සභාව

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සටහන්

| | සටහන් | 2022 | 2021 |
|---|---|---|---|
| | | රු | රු |
| සටහන 04 | | | |
| වෙනත් වියදම් | | | |
| ගණකාධිකාරි ගාස්තු | | 150,000.00 | 50,000.00 |
| විගණන ගාස්තු | | 97,810.00 | 95,000.00 |
| දුරකථන ගාස්තු | | 58,492.34 | 52, 487 |
| වෛද්‍ය සායන වියදම් | | 977,024.58 | 73,615.00 |
| විදුලි ගාස්තු | | 133,049.24 | 87, 413 |
| ජල ගාස්තු | | 125,163.06 | 78, 442 |
| ගමන්වියදම් | | 14,720.00 | 19,920.00 |
| තැපැල් වියදම් | | 48,500.00 | 10,780.00 |
| මුද්‍රණ වියදම් | | 136,730.00 | 281,000.00 |
| විවිධ වියදම් | | 7,700.00 | 8,675.00 |
| භාෂා පරිවර්තන ගාස්තු | | 100,665.00 | 38,530.00 |
| සභාපති දීමනා | | 825,000.00 | 900,000.00 |
| වෛද්‍ය සභා රැස්වීම් දීමනා | | 426,000.00 | 342,000.00 |
| පාරිතෝෂික වියදම් | | 808,937.50 | 468,375.00 |
| නිති ගාස්තු | | 501,870.00 | 105,000.00 |
| අලුත්වැඩියා වියදම් | | 34,083.00 | 37,345.00 |
| ගෙවල් කුලි | | 22,000.00 | 24,000.00 |
| සනිපාරක්ෂක වියදම් | | 3,270.00 | 193, 430 |
| ඉන්දන වියදම් | | - | 19,136.00 |
| දැන්වීම් ගාස්තු | | - | 369,684.00 |
| ප්‍රවාහන වියදම් | | 70,375.00 | 9,360.00 |
| උත්සව වියදම් | | 176,950.00 | - |
| දඩ හා අධිබාර | | 1,829,305.00 | - |
| වෛද්‍යවරුන්ගේ සුහද හමුව | | 297,500.00 | - |
| Web Site | | 40,800.00 | - |
| | | 6,885,944.72 | 2,852,420.00 |

හෝමියෝපති වෛද්‍ය සභාව

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| | සටහන් | 2022 | 2021 |
|---|---|---|---|
| | | රු | රු |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහයන් | | | |
| ලැබීම් | | | |
| රජයෙන් ලද පුනරාවර්ථන ප්‍රදානය | | 34,807,958.15 | 24,429,201.00 |
| බැංකු පොලී | | 77,937.11 | 69,460.00 |
| වෙනත් ලැබීම් | 1 | 3,244,845.00 | 10,200.00 |
| | | 38,130,740.26 | 24,508,861.00 |
| ගෙවීම් | | | |
| සේවක පිරිවැය | 2 | 29,674,689.03 | 21,300,344.00 |
| බැංකු පොලී | | | 350.00 |
| වෙනත් ගෙවීම් | 03 | 6,334,951.18 | 3,128,857.00 |
| | | 36,009,640.21 | 24,429,551.00 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහයන් | | 2,121,100.05 | 79,310.00 |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහයන් | | | |
| රජයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදානය | | - | 2,772,095.00 |
| දේපල පිරියත හා උපකරණ | | (145,300.00) | (1,838,161.00) |
| ගොඩනැගිලි පුනුරුත්තාපන සඳහා | | (1,206,506.00) | (933,934.00) |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | | (1,351,806.00) | - |
| මුදල් හා මුදල් හා සමාන දෑ හි ශුද්ධ වැඩිවීම | | 769,294.05 | 79,310.00 |
| කාලාච්ඡේදය ආරම්භයේදී වූ මුදල් හා මුදල් සමාන දෑ | | 2,681,040.00 | 2,601,730.00 |
| කාලච්ඡේදය අවසානයේදී වූ මුදල් හා මුදල් සමාන දෑ | | 3,450,334.05 | 2,681,040.00 |

සටහන

| | 2022 | 2021 |
|---|---|---|
| මුදල් හා මුදලට සමාන දෑ | | |
| කොමර්ෂල් බැංකුව | 2,094,192.72 | 2,022,267.00 |
| ලංකා බැංකුව | 1,102,787.83 | 462,873.00 |
| ලංකා බැංකුව රාජගිරිය | 251,100.00 | 195,900.00 |
| මුදල් | 2,253.50 | |
| | 3,450,334.05 | 2,681,040.00 |

මෙම මුල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම හෝමියෝපති වෛද්‍ය සභාව විසින් දරණ බව සහතික කරමු

| ලේඛකාධිකාරි | සභාපති | කමිටු සමාජික | සකස් කළේ |
|---|---|---|---|
| හෝමියෝපති | හෝමියෝපති | හෝමියෝපති | ගණකාධිකාරි |
| වෛද්‍ය සභාව | වෛද්‍ය සභාව | වෛද්‍ය සභාව | T.M.J. තෙන්නකෝන් |

S. J. ASSOCIATES Accountant's Auditors 41, Main Street, Veyangoda

Registrar
Homoeopathic Medical Council
No. 94, Welisara,
Ragama.

Dr.D.M.Ashan Thilanka
President
Homoeopathic Medical Council

## හෝමියෝපති වෛද්‍ය සභාව

## 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සටහන්

| | සටහන් | 2022 | 2021 |
|---|---|---|---|
| | | රු | රු |
| සටහන 01 | | | |
| වෙනත් අයභාර | | | |
| වාර්ෂික ගාස්තු | | 30,950.00 | 5,200.00 |
| පරිත්‍යාග | | 605,245.00 | |
| වාහන බලපත්‍ර | | 103,500.00 | |
| ඩිප්ලෝමා ඇතුලත්වීමේ ගාස්තු | | 20,000.00 | |
| වෛද්‍යවරුන්ගේ සුහද හමුව | | 345,000.00 | |
| විභාග ගාස්තු | | 728,000.00 | |
| හැඳුනුම්පත් ගාස්තු | | 95,750.00 | |
| ඇතුලත්වීමේ ගාස්තු | | 67,900.00 | |
| වැඩමුළු සඳහා ලැබීම | | 1,234,000.00 | |
| වෛද්‍ය වාර්ත පොත් | | 8,000.00 | |
| විවිධ ලැබීම | | 6,500.00 | 5,000.00 |
| | | 3,244,845.00 | 10,200.00 |
| සටහන 02 | | | |
| වැටුප් වේතන හා සේවක ප්‍රතිලාභ | | | |
| කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා | | 26,476,627.31 | 18,506,881.00 |
| සේවක අර්ථසාධක අරමුදල් | | 2,550,604.53 | 2,236,211.00 |
| සේවා නියුක්ති භාර අරමුදල් | | 647,457.19 | 557,252.00 |
| | | 29,674,689.03 | 21,300,344.00 |

හෝමියෝපති වෛද්‍ය සභාව

## 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සටහන්

| | සටහන් | 2022 | 2021 |
|---|---|---|---|
| | | රු | රු |
| සටහන 03 | | | |
| <u>අනෙකුත් ගෙවීම්</u> | | | |
| ලිපි ද්‍රව්‍ය වියදම් | | 25,155.00 | 19,739.00 |
| සංග්‍රහ වියදම් | | 157,219.50 | 35,748.00 |
| ගණකාධිකාරී ගාස්තු | | 50,000.00 | 50,000.00 |
| විගණන ගාස්තු | | | 148,800.00 |
| දුරකථන ගාස්තු | | 55,420.06 | 55,150.00 |
| වෛද්‍ය සායන වියදම් | | 932,674.58 | 81,956.00 |
| විදුලි ගාස්තු | | 118,696.68 | 91,456.00 |
| ජල ගාස්තු | | 132,524.36 | 79,029.00 |
| ගමන්වියදම් | | 14,720.00 | 21,000.00 |
| තැපැල් වියදම් | | 48,500.00 | 10,780.00 |
| මුද්‍රණ වියදම් | | 136,730.00 | 281,000.00 |
| විවිධ වියදම් | | 7,700.00 | 48,925.00 |
| භාෂා පරිවර්තන ගාස්තු | | - | 41,493.00 |
| සභාපති දීමනා | | 825,000.00 | 825,000.00 |
| වෛද්‍ය සභා රැස්වීම් දීමනා | | 426,000.00 | 342,000.00 |
| පාරිතෝෂික වියදම් | | 260,703.00 | |
| ඖෂධ භගාලම් මිලට ගැනීම | | - | 255,336.00 |
| ඖෂධ කවර මිලට ගැනීම | | - | 115,520.00 |
| නීති ගාස්තු | | 501,870.00 | 105,000.00 |
| අලුත්වැඩියා වියදම් | | 34,083.00 | 37,345.00 |
| ගෙවල් කුලී | | 22,000.00 | 24,000.00 |
| සනීපාරක්ෂක වියදම් | | 3,270.00 | 193,430.00 |
| ඉන්ධන වියදම් | | - | 19,136.00 |
| දැන්වීම් ගාස්තු | | 132,030.00 | 237,654.00 |
| ප්‍රවාහන වියදම් | | 106,100.00 | 9,360.00 |
| උත්සව වියදම් | | 176,950.00 | - |
| දඩ හා අධිභාර | | 1,829,305.00 | - |
| වෛද්‍යවරුන්ගේ සුහද හමුව | | 297,500.00 | - |
| Web Site | | 40,800.00 | - |
| | | 6,334,951.18 | 3,073,370.00 |

හෝමියෝපති වෛද්‍ය සභාව
ස්කන්ධය වෙනස්වීම (සංචිත)

| | 2022 රු |
|---|---|
| 2022.01.01 දිනට ශේෂය ප්‍රාග්ධන ගිණුම | 2,562,144.00 |
| 2022.01.01 දිනට ප්‍රාග්ධන ප්‍රතිපාදන ගිණුමේ ශේෂය | 11,160,321.00 |
| 2022 වර්ෂයේ රජයේ ප්‍රාග්ධන ප්‍රතිපාදන | - |
| පෙර වර්ෂයේ ගැලපුම් ගිණුම | - |
| සමුච්චත ඌනතා / අතිරික්තතා 2021.01.01 | (3,222,814.00) |
| සමුච්චිත ඌණතාවය/අතිරික්තය | 900,779.21 |
| 2022.12.31 දිනට ශේෂය | 11,400,430.21 |

## 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පිරික්සුම

| | හර | බැර |
|---|---|---|
| බැංකුව (කොමර්ෂල්) | 2,094,192.72 | |
| ලංකා බැංකුව | 1,102,787.83 | |
| මහජන බැංකුව | 251,100.00 | |
| මුදල් | 2,253.50 | |
| වෙනත් උපකරණ | 1,450.00 | |
| පිරියත උපකරණ | 6,669,503.00 | |
| ක්ෂය වෙන් කිරිම | | 2,953,214.80 |
| ගෙවිය යුතු විගණන ගාස්තු | | 195,620.00 |
| ගෙවිය යුතු ගණකාධිකාරි ගාස්තු | | 150,000.00 |
| ගෙවිය යුතු දුරකථන ගාස්තු | | 7,243.28 |
| ගෙවිය යුතු විදුලි ගාස්තු | | 16,544.56 |
| ගෙවිය යුතු ජල ගාස්තු | | 6,943.70 |
| ගෙවිය යුතු පාරිතෝෂිත දීමනා | | 3,091,142.50 |
| ගෙවිය යුතු ගමන් වියදම් | | |
| ගෙවිය යුතු සායනික වියදම් | | 54,935.00 |
| ගෙවිය යුතු සභාපති දිමනා | | 75,000.00 |
| ගෙවිය යුතු භාෂා පරිවර්තන ගාස්තු | | 100,665.00 |
| ප්‍රාග්ධනය | | 2,562,144.00 |
| රජයේ මුලධන ප්‍රතිපාදන (සංචිත) | | 11,160,321.00 |
| සමුච්චිත ඌණතා අතිරික්තතා ගිණුම | 3,192,398.00 | |
| පෙර වර්ෂයේ ගැලපුම් ගිණුම | 30,416.00 | |
| පුනරාවර්ථන වියදම් සඳහා රජයේ ප්‍රදානයන් | | 34,807,958.15 |
| වැටුප් හා වෙතන | 26,476,627.31 | |
| අර්ථසාධක අරමුදල් | 2,550,604.53 | |
| සේවා නියුක්ති භාර අරමුදල් | 647,457.19 | |
| දුරකථන වියදම් | 58,492.34 | |
| විදුලි වියදම් | 133,049.24 | |
| ජල වියදම් | 125,163.06 | |
| සායන වියදම් | 977,024.58 | |
| ලිපි ද්‍රව්‍ය වියදම් | 25,155.00 | |
| ගමන් වියදම් හා නවාතැන් ගාස්තු | 70,375.00 | |
| සංග්‍රහ වියදම් | 157,219.50 | |
| තැපැල් වියදම් | 48,500.00 | |
| මුද්‍රණ ගාස්තු | 136,730.00 | |
| නීති ගාස්තු | 501,870.00 | |
| පරිවර්තන ගාස්තු | 100,665.00 | |
| ලැබු බැංකු පොලි | | 77,937.11 |

| | | |
|---|---|---|
| වාර්ෂික ගාස්තු | | 30,950.00 |
| පරිත්‍යාග (Bodi Clinic) | | 605,245 |
| වාහන බලපත්‍ර | | 103,500 |
| ඩිප්ලෝමා ඇතුලත්වීමේ ගාස්තු | | 20,000 |
| වෛද්‍යවරුන්ගේ සුහද හමුව | | 345,000 |
| විභාග ගාස්තු | | 728,000 |
| හැඳුනුම්පත් ගාස්තු | | 95,750 |
| ඇතුලත්වීමේ ගාස්තු | | 67,900 |
| වැඩමුළු සඳහා ලැබීම | | 1,234,000 |
| වෛද්‍ය වාර්ත පොත් | | 8,000 |
| විවිධ ලැබීම් | | 6,500 |
| වාර්ෂික ක්ෂය | 486,952.80 | |
| විගණන ගාස්තු | 97,810.00 | |
| ගණකාධිකාරි ගාස්තු | 150,000.00 | |
| ඖෂධ බහාලුම් හා කවර වියදම් | 384,731.00 | |
| ගෙඩනැගිලි පුනුරුත්තාපන හා වැඩි දියුනු කිරිම | 7,547,721.00 | |
| පාරිතෝෂික දීමනා | 808,937.50 | |
| සභාපති දිමනා | 825,000.00 | |
| වෛද්‍ය සභා රැස්වීම් දීමනා | 426,000.00 | |
| අලුත්වැඩියා වියදම් | 34,083.00 | |
| වෛද්‍යවරුන්ගේ සුහද හමුව | 297,500.00 | |
| ගෙවල් කුලී | 22,000.00 | |
| සනීපාරක්ෂක වියදම | 3,270.00 | |
| ප්‍රවාහන වියදම් | 14,720.00 | |
| ගෙවිය යුතු වරිපනම් | | 2,000.00 |
| දඩ හා අධිබාර | 1,829,305.00 | |
| උත්සව වියදම් | 176,950.00 | |
| Web site | 40,800.00 | |
| වෙනත් වියදම් | 7,700.00 | |
| | 58,506,514.10 | 58,506,514.10 |

# 11. විගණන වාර්තාව

2016 අංක 10 දරණ හෝමියෝපති පනතට අනුව පිහිටුවනු ලැබූ හෝමියෝපති වෛද්‍ය සභාව මගින් සිදු කරනු ලබන කාර්යයන් ඉතාමත් සාර්ථක ලෙස 2022 වර්ෂයේදීද සිදු කරනු ලැබුණි. මෙම වෛද්‍ය සභාව යටතේ හෝමියෝපති ක්ෂේත්‍රයේ දියුණුවට සහ ජනතාවගේ සෞඛ්‍ය නංවාලීම සහ පෙර විගණනය මඟින් පෙන්වා දී තිබූ ගැටළු විසඳාලීම සඳහා සුවිශේෂී තීරණ රැසක් සිදු කරන ලදී. ශ්‍රී ලංකාව මුහුණ දෙන ලද ආර්ථික අර්බුද හා දේශපාලන අර්බුද හමුවේ පැන නගින ලද බොහෝ ගැටළු මැඩපවත්වමින් ජනතාවගේ සෞඛ්‍ය නංවාලීම සඳහා හෝමියෝපති වෛද්‍ය ක්ෂේත්‍රයේ සුවිශේෂී කාර්යයක් සිදු කරන ලදී.

වෛද්‍ය සභාවට අනුමත ගිණුම් අංශයක් නොතිබුණු බැවින් සහ වෛද්‍ය සභාවට ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැති වීම නිසා මෙම වසරේදී ද සභාවේ ගිණුම් කටයුතු සිදුකරනු ලැබුවේ දේශීය වෛද්‍ය අංශයේ ගිණුම් අංශය මගිනි.කෙසේ වෙතත් මතුවී තිබූ බොහෝ ගැටළු සාර්ථකව මැඩ පවත්වා ගනිමින් සභාවේ සහ කාර්යමණ්ඩලයේ මෙන්ම හෝමියෝපති නිදහස් සායන වලද කටයුතු ඉතා සාර්ථක ලෙස සහ කඩිනමින් හෝමියෝපති වෛද්‍ය සභාව ඉටු කල බව සඳහන් කල යුතුය.

මෙම වසරට අදාළව සකස් කෙරුණු සහා සම්මත වූ අවසන් ගිණුම් වාර්තා, මේ සමඟ ඉදිරිපත් කෙරේ. 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විගණනයේදී 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ විගණන වාර්තාව මෙම වාර්තාවට ඇතුළත් කර ඇත.

වෛද්‍ය ඩී. එම්. අෂාන් තිලංක
සභාපති
හෝමියෝපති වෛද්‍ය සභාව

# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ටීඑච්ඕ/ඒ/එච්එම්සී/ එෆ්ඒ/2022/04

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2024 දෙසැම්බර් 28 දින

සභාපති
හෝමියෝපති වෛද්‍ය සභාව

**හෝමියෝපති වෛද්‍ය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

එච්.එම්.යූ.එස්.ඒ.විජේකෝන්
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත්: 01. ලේකම් , සෞඛ්‍ය අමාත්‍යාංශය
02. ලේකම් , මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව   இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.   No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34   +94 11 2 88 72 23   ag@auditorgeneral.gov.lk   www.naosl.gov.lk

# ජාතික විගණන කාර්යාලය
## தேசிய கணக்காய்வு அலுவலகம்
## NATIONAL AUDIT OFFICE


මගේ අංකය / எனது இல. / My No. } ටීඑච්ඕ/ඒ/ එච්එම්සී/එෆ්ඒ/2022/04    ඔබේ අංකය / உமது இல. / Your No. }    දිනය / திகதி / Date } 2024 දෙසැම්බර් 28 දින

සභාපති,
හෝමියෝපති වෛද්‍ය සභාව

**හෝමියෝපති වෛද්‍ය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

හෝමියෝපති වෛද්‍ය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවියයුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථාකාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 1හි 80 ඡේදය පරිදි මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළියෙල කිරීමේදී වර්ෂයට අඩු කාලපරිච්ඡේදයක් තුළ නිරවුල් කිරීමට නියමිත බැරකම් පමණක් ජංගම බැරකම් යටතේ වර්ගීකරණය කළ යුතු වුවත්, ඊට අනුකූල නොවන ලෙස පාරිතෝෂික සඳහා වෙන්කිරීම් මුළු වටිනාකම වූ රු.3,091,142ක් ජංගම බැරකම් යටතේ දක්වා තිබුණි.

(ආ) ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණු පිරිවැය රු.7,547,721ක්වූ ගොඩනැගිලි පුනරුත්ථාපනය හා වැඩිදියුණුකිරීම් වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ක්ෂය ප්‍රතිපාදනයක් කර නොතිබුණි.




අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34   +94 11 2 88 72 23   ag@auditorgeneral.gov.lk   www.naosl.gov.lk

(ඇ) අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂය තුළ වෛද්‍ය සභාව සඳහා පිරියත හා උපකරණ මිළදීගැනීම වෙනුවෙන් වැයකරන ලද රු.971,349ක් වූ රජයේ ප්‍රාග්ධන ප්‍රතිපාදන මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඈ) සෞඛ්‍ය අමාත්‍යාංශයේ දේශීය වෛද්‍ය අංශයේ තොරතුරුවලට අනුව වෛද්‍ය සභාවේ කටයුතු වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ දරන ලද රජයේ පුනරාවර්තන වියදම රු.29,810,198ක් වුවද, විගණනය වෙත ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශනවලට අනුව එය රු.34,807,958ක් වූයෙන් රු.4,997,760ක් වැඩියෙන් දක්වා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂයේ වෛද්‍ය සභාව වෙනුවෙන් අවස්ථා 26කදී වැය කර තිබුණු රු.1,451,562ක් වූ වියදම් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණු අතර ඒ හේතුවෙන් රජයෙන් ලද පුනරාවර්තන ප්‍රතිපාදන හා අදාල වියදම් ගිණුම් එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ii) වර්ෂය තුළ සේවක අර්ථසාධක හා සේවක භාරකාර අරමුදල් වෙත ගෙවන ලද එකතුව රු.4,831,551ක් වූ මුදලක් ද්විගණනයවීම හේතුවෙන් වර්ෂයේ පුනරාවර්තන ප්‍රතිපාදන හා කාර්යමණ්ඩල වැටුප් හා දීමනා එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(iii) එක්සත් රාජධානියෙහි බෝධිසායනය විසින් වෛද්‍ය සායන පැවැත්වීම සඳහා වෛද්‍ය සභාව වෙත ලබා දී තිබුණු රු.760,000ක ප්‍රදානයක් ආදායමක් ලෙස වෙනම හඳුනාගැනීමකින් තොරව රජයේ පුනරාවර්තන ප්‍රතිපාදන ලෙස සලකා ගිණුම්ගත කර තිබුණි.

(iv) එකතුව රු.271,585ක් වූ හිඟ වැටුප් ගෙවීම් ද්විගණනයවීම හේතුවෙන් පුනරාවර්තන ප්‍රතිපාදන සහ කාර්යමණ්ඩල වැටුප් හා දීමනා එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(v) නීතිමය කටයුත්තක් හේතුවෙන් ගෙවීම්කර නොතිබුණු හිටපු ලේඛකාධිකාරීගේ රු.260,703ක් වූ පාරිතෝෂික මුදල් වියදමක් ලෙස සලකා පුනරාවර්තන ප්‍රතිපාදන ගිණුමට බැරකර පාරිතෝෂික වියදම් ගිණුම හරකර තිබීම හේතුවෙන් වර්ෂයේ පුනරාවර්තන ප්‍රතිපාදන සහ පාරිතෝෂික වියදම් එම වටිනාකමින් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 සභාවේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු**

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබාදීමට බලාපොරොත්තු වන වෛද්‍ය සභාවේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ

විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතික වීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමග හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබා ගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

වෛද්‍ය සභාවේ 2022 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාවේ ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, වෛද්‍ය සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය වෛද්‍ය සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝවෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා වෛද්‍ය සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

වෛද්‍ය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, වෛද්‍ය සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන

පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තව දුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් වෛද්‍ය සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර,

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා වෛද්‍ය සභාව පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව වෛද්‍ය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව වෛද්‍ය සභාවේ යම් සාමාජිකයෙකුට වෛද්‍ය සභාව සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ වෛද්‍ය සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීති රීති හා විධානවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2016 අංක 10 දරන හෝමියෝපති පනතේ | |
| (i) 15 වගන්තියේ (ඇ) හා (ඉ) උප වගන්ති | හෝමියෝපති වෛද්‍ය සභාව විසින් හෝමියෝපති ආයතනයක් පිහිටුවා පවත්වාගෙන යාමට කටයුතු කර නොතිබුණු අතර හෝමියෝපති වෛද්‍ය ක්‍රමයට ප්‍රතිකාර ලබාදෙන හෝමියෝපති ආයතන නියාමනයට අදාලව අවම ප්‍රමිතීන් තීරණය කර ඒ අනුව එම ආයතන නියාමනයට හා පාලනයට අවශ්‍ය පියවර ගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි. |
| (ii) 31(1) උප වගන්තිය | හෝමියෝපති ඖෂධවේදීන් ලියාපදිංචිකිරීම සඳහා හෝමියෝපති ඖෂධවේදී ලේඛනයක් පවත්වාගෙන යාමට කටයුතු කළයුතු වුවද, මෙම විධිවිධාන ක්‍රියාත්මකකිරීම සඳහා වූ රෙගුලාසි සම්පාදනය කර නොතිබීම හේතුවෙන් 2024 ඔක්තෝබර් 21 දින |

| | |
|---|---|
| | වනවිටත් එවැනි ලේඛනයක් පවත්වාගෙන යාමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 16.1 වගන්තිය | සේවයෙහි ස්ථිරකිරීම, උසස් කිරීම හා කාර්යක්ෂමතා කඩඉම්වලින් උසස් කිරීම ආදී විභාග නියමිත දිනවල පැවැත්වීමට ආයතන ප්‍රධානී වගබලා ගතයුතු වුවත්, 2014 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා බඳවාගෙන තිබුණු තනතුරු 04 කට අදාළව නිලධාරීන් 30 දෙනෙකු වෙනුවෙන් විගණිත දිනය වන 2024 ඔක්තෝබර් 21 දින වනවිටත් කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීමට කටයුතු කර නොතිබුණි. මේ හේතුවෙන් ඇතැම් නිලධාරීන් සේවයෙහි ස්ථිර කළ නොහැකිව තිබුණු අතර ඔවුන්ගේ පරිවාස කාලය දීර්ඝ කිරීමටද කටයුතු කර නොතිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 133 | වෛද්‍ය සභාව සඳහා අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා නොතිබුණු අතර අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය මගින් හෝ සමාලෝචිත වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 395(ඇ) | බැංකු ගිණුම්වල එක් එක් මාසයේ ගණුදෙනු තත්ත්වය සම්බන්ධයෙන් ඊළඟ මාසයේ 15 දිනට පෙර බැංකු සැසඳුමක් පිළියෙල කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයට අදාලව ලංකා බැංකුවේ අංක 0002026466 දරන ජංගම බැංකු ගිණුම සම්බන්ධයෙන් බැංකු සැසඳුම් ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි. |
| (ඈ) 2018 නොවැම්බර් 14 දිනැති අංක 2/2018 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව රාජ්‍ය බැංකුවක පවත්වාගෙන යන ගිණුමක මුදල් තැන්පත් කළ යුතු වුවද, 2009 වර්ෂයේදී අයකර තිබුණු රු.1,204,500ක පාඨමාලා ගාස්තු පෞද්ගලික බැංකුවක ඉතිරි කිරීමේ ගිණුමක තැන්පත්කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ අවසානය වනවිට එම ගිණුමේ ශේෂය රු.2,094,193 ක් විය. 2022 නොවැම්බර් 30 දිනැති අංක 6.2 දරන පාලක මණ්ඩල තීරණය මගින් මෙම ඉතිරිකිරීමේ ගිණුම අවලංගු කර ස්ථිර |

|  |  |
|---|---|
| | තැන්පතුවක් ලෙස ලංකා බැංකුවේ තැන්පත් කිරීමට තීරණය කර තිබුණද, සමාලෝචිත වර්ෂයේ අවසානය වනවිටත් ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. |
| (ඊ) 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.6 වගන්තිය | මූල්‍ය වර්ෂය අවසන් වීමෙන් දින 60ක් ඇතුළත විගණකාධිපති වෙත අනුමත මූල්‍ය ප්‍රකාශන හා වාර්ෂික වාර්තාවේ කෙටුම්පතක් ඉදිරිපත් කළ යුතු වුවද, 2022 මූල්‍ය වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන මාස 17 කට වඩා වැඩි කාල ප්‍රමාදයක් සහිතව 2024 අගෝස්තු 23 දින ඉදිරිපත් කර තිබුණි. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතකර නොමැති බව.

## 3. වෙනත් කරුණු

(අ) 2016 අංක 10 දරන හෝමියෝපති පනතේ විධිවිධානවලට අනුව හෝමියෝපති වෛද්‍ය විද්‍යාලයක් ආරම්භ කිරීම සඳහා 2008 වර්ෂයේදී ගොඩනැගිල්ලක් ඉදිකර 2009 වර්ෂයේදී ඒ සඳහා රු.1,199,254ක ලී බඩු හා වෙනත් අවශ්‍ය උපකරණ සපයාගෙන තිබුණි. එහි අධ්‍යයන කටයුතු ආරම්භ කිරීමට අදාළ නීතිමය රාමුව පිළියෙල කර නොතිබීම හා අවශ්‍ය මානව සම්පත් නොමැතිවීම හේතුවෙන් 2024 ඔක්තෝබර් 21 දින වන විටත් අධ්‍යයන කටයුතු ආරම්භකිරීමට නොහැකි වී තිබුණි. ඒ අනුව මිලදීගෙන තිබුණු ස්ථාවර වත්කම් වර්ෂ 15 කට අධික කාලයක් තිස්සේ නිෂ්කාර්යව පැවතුණු අතර ගොඩනැගිල්ල අරමුණුගත කාර්යයෙන් බැහැරව හෝමියෝපති වෛද්‍ය සභාවේ කාර්යාලය පවත්වාගෙනයාම සඳහා භාවිතා කර තිබුණි.

(ආ) මහජන මුදල් රැස්කිරීම සඳහා බලයක් ලැබෙන කිසිදු ප්‍රතිපාදනයක් නොමැතිව හා විධිමත් අනුමැතියකින් තොරව "හෝමියෝපති අරමුදල" නමින්, එකක් රු.5,000ක වටිනාකමක් සහිත ආධාර පත්‍ර පොත් මුද්‍රණයකර තිබුණි. මුද්‍රණය කළ වර්ෂය, මුද්‍රණය කළ මුළු ආධාර පත්‍ර සංඛ්‍යාව, ආධාර පත්‍ර අලෙවි ආදායම හා එම මුදල් බැංකුගත කිරීම පිළිබඳ තොරතුරු කිසිවක් සභාව සතුව නොතිබුණි. පැවති පහළම පොත් අංකය හා ඉහළම පොත් අංකය අතර පොත් 159ක හිඟයක් පැවති අතර එමගින් රැස්කළ හැකිව තිබුණු මුළු මුදල රු.795,000 ක් විය. ඉන් පොත් 416ක තොගයක් ඉතිරිව පැවතුණු අතර විගණනය විසින් අවස්ථා කිහිපයකදී පෙන්වා දී තිබුණු නමුත් 2024 ඔක්තෝබර් 21 දින වනවිටත් එම ආධාර පත්‍ර පොත් අවලංගු කිරීමට හෝ අපහරණය කර ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2022 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත කාර්යමණ්ඩලය 48ක් වුවද තථ්‍ය කාර්යමණ්ඩලය 35 ක් විය. සභාව සඳහා අත්‍යවශ්‍ය වෛද්‍ය නිලධාරීන් 02ක් හා

ඖෂධ සංයෝජකවරු 09 දෙනෙකුගේ පුරප්පාඩු පිරවීමට 2024 ඔක්තෝබර් 21 දින වන විටත් කටයුතුකර නොතිබුණි.

(ඇ) 2022 සමාලෝචිත වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මත හෝමියෝපති සංවර්ධන අරමුදලක් පිහිටුවා එම අරමුදලට මුදල් රැස්කිරීම වෙනුවෙන් මහජන බැංකුවේ ජංගම ගිණුමක් විවෘත කර පරිත්‍යාග ලෙස රු.1,180,245 ක මුදලක් රැස් කර තිබුණු අතර එම අරමුදලින් ගොඩනැගිලි පුනරුත්තාපනය හා වැඩිදියුණු කිරීම වෙනුවෙන් රු.575,000ක් හා වෙබ් පිටුවක් නිර්මාණය කිරීම සඳහා රු.20,800ක වියදමක් දරා තිබුණි. මෙම ආදායම හෝමියෝපති සංවර්ධන අරමුදලේ ආදායම ලෙස නොදක්වා බෝධි සායනය සඳහා ලද ආදායම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු අතර වෛද්‍ය සභාවේ අරමුණු ගත කාර්යයන්ගෙන් බැහැරව වෛද්‍යවරුන්ගේ සුහද හමුවක් සඳහා රු.345,000ක මුදලක් එම ගිණුමට රැස්කර එම මුදලින් රු.297,500ක් වැයකර තිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති